1 වෙනි පිටුවෙන් -

# මෙම දුෂ්ට කුමන්ත්‍රණය පරදවමු

හේතුව වශයෙන් ගත හැක්කේ ඔහුගේ මෙම ක්‍රියාදාමය රජය සමග ඔහු තුළ ඇති කිසියම් පුද්ගලික කෝන්තරයක් පිරිමහ ගන්නට බව ද කාටත් දැන් තේරුම් ගත හැකිව තිබේ.

## ජෙනරාල්ගේ මතභේදකාරි ප්‍රකාශනය සහ ඉන් ඇතිවූ මහත් කලබැගෑනිය

පසුගිය මස එනම් දෙසැම්බර් 13 වෙනිදා ජෙනරාල් සරත් ෆොන්සේකා ශ්‍රීලංකාවේ සන්ඩේ ලීඩර් ඉංග්‍රීසි පුවත්පතේ කතුවරිය වන ෆෙඩ්රිකා ජැන්ස් සමග කළ සාකච්ඡාවකදී කීවේ යුද්ධය අවසන්වීමට පෙර දිනයේ තමන් යටත්වූ බව ප්‍රකාශකරන සුදු කොඩි ඔසවාගෙන හමුදාව වෙත පැමිණි කොටි නායකයන් තිදෙනෙක් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් අත් අඩංගුවට නොගෙන ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ඇමතිගේ අණ පරිදි 58 වෙනි රෙජමේන්තුවේ අණදෙන නිලධාරි ශවීන්ද්‍ර සිල්වා විසින් ඔවුන්ට වෙඩිතබා මරුමුවට පත් කරන ලද බවයි.

මෙම බරපතළ චෝදනාව ප්‍රකාශ කළේ අන් කිසිවෙකු නොව යුද ජයග්‍රහණයට මූලිකවූයේ තනිකරම තමාම යයි උළුප්පා පෙන්වන ලද ඒ ත්‍රිවිධ හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරියාව සිටි ජෙනරාල් සරත් ෆොන්සේකා විසින් ම ය. මෙම ප්‍රකාශය බටහිර බලවතුන්ටද, එක්සත් ජාතීන්ටද, ශ්‍රීලංකා රජයට එරෙහිව යුධ අපරාධ චෝදනා ගෙනෙන්නට මහා රුකුලක් වූ බව නිසැකය. එල්ටීටීඊ ද්‍රවිඩ ත්‍රස්තවාදය පැරදවීම ගැන හා බටහිර රටවල උද්ඝෝෂණයන් ශ්‍රීලංකා රජය යුද සමයේදී නොතැකීම ආදිය මත ලංකාව කෙරෙහි තරහෙන් පසු වූ ඉහතකී මහතැන් අපට දඬුවම් කරන්නට සුදුසු අවස්ථාවක් බලමින් සිටියදී පොන්සේකාගේ මේ ඉවක් බවක් නැති අභූත ප්‍රකාශය ඔවුන්ට අවශ්‍ය පොට පාදා ගැන්මට දැන් හොඳ හේතුවක් වී ඇත.

යුධ අපරාධ පිළිබඳව සොයාබැලීමට පත්කර සිටින එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂ කොමසාරිස්වරයා වන පිලිප් ඇල්ස්ටන් මේ නොබෝදා ශ්‍රීලංකා ජනාධිපතිවරයාගෙන් ජෙනරාල්ගේ ප්‍රකාශයේ සත්‍යතාව ගැන කරුණු විමසා ලිපියක් එවා තිබේ. මෙය ඉතා බරපතල කරුණක් බවට පෙරළෙමින් පවතී. කරුණු ඔප්පු වුවහොත් නිසැකවම රටේ නායකයන්ද, යුද්ධයට සහභාගිවූ සොල්දාදුවන්ද යුදධ අපරාධවලට වැරදිකරුවන් බවට තීන්දු කෙරෙනවා ඇත. මෙම චෝදනාවල් මත පමණක් පමණක් වැරදිකරුවන් කළ නොහැකිය. ඒ සඳහා ශක්තිමත් සාක්ෂි අවශ්‍ය බව සබෑය. කරුණු එසේ නමුත් සරත් පොන්සේකාගේ ප්‍රකාශනය අපේ රට ලත් ඒ දැවැන්ත යුද ජයග්‍රහණයට සිදු කළේ පිළියම් කළ නොහැකි විශාල හානියකි.

මේ සියල්ල සිදුවීමෙන් පසුව යුද හමුදාව පාවා දුන්නේයයි රජයෙන් ද ජනතාවගෙන් ද චෝදනා අවලාද එල්ලවෙත්ම තමන් කළ මෝඩ තකතිරු ක්‍රියාව වටහාගත් ජෙනරාල්වරයා ප්‍රකාශය පළවී දින දෙකකට පසු එය අනික් පැත්ත ගසන්නට තමා එසේ කීවේ නැතැයිද, තමා කී දෙය විකෘතිකර පළකර ඇතැයිද, කී නමුත්, ෆෙඩ්රිකා ජැන්ස් කියන්නේ එම ප්‍රකාශයේ සෑම වචනයක්ම ඔහුගේ කටින් පිටවූ ඒවා බවත්, ඔහුගේ හඬ ඇතුළත් ටේප් පටිය තමා සතුව ඇති බවත්ය.

සරත් ෆොන්සේකා මහතා ගලේ පහරා එය වසාගන්නට නොහැකිව වටපිට බලන බළලෙකුගේ තත්වයට දැන් පත්ව සිටී. වගකීම කින් තොරව, හොඳ නරක නොවිමසා, කටට ආ දෙය කියන ඔහු දේශපාලන වශයෙන් ඉතා අඳබාල තත්වයක සිටින බව පැහැදිලිය. එවැනි කෙනෙකු රටේ නායකත්වයට පත්කරන්නට තරම් සුදුසුදැයි බහුතරයක් අසති.

මේ දේවල් මෙසේ සිදුවෙද්දී ලෝකය පුරා සිටින දෙමළ ඩයස්පෝරා දැන් කුල්මත් සිතින් බලා සිටිති. මක්නිසාද ජෙනරාල්ගේ ප්‍රකාශයෙන් ඔවුන්ගේ අභිමතාර්ථය ඉෂ්ට වූ බැවිනි. කොටි සංවිධානයට එරෙහිව නැගී සිට එය විනාශ කළ ශ්‍රීලංකා හමුදා අවමානයට ලක්කිරීමටත්, යුද්ධය දිනුවේ හරි මාර්ගයෙන් නොව දෙමළ වැසියන් නිර්දය ලෙස තලා පෙළා වධ හිංසා පැමිණවීමෙන් යයි දෙමළ ඩයස්පෝරාව ගෙනගිය ප්‍රචාරයට ජෙනරාල්ගේ අද්භූත ප්‍රකාශනයෙන් හොඳ සාක්ෂියක් ලැබුණු බැවිනි. එසේම රජයේ හා හමුදාවේ හා සිංහළ ජනතාවගේ ඒකාබද්ධතාව බිඳින්නට මුදල් වියදම් කිරීමෙන් පුද්ගලයින් බාගන්නට ගන්නා කොටින්ගේ වෑයම අවසානයේ සාර්ථක වීය. කෙසේ හෝ තමනට අවශ්‍ය බළල් අත ඔවුන්ට ලැබී ඇත. එපමණක්ද නොව ඒ බළල් අත කිසිදු ලජ්ජාවක් නැතිව ප්‍රභාකරන්ගේ අම්මාගෙන් හා තාත්තාගෙනුත් දැන් හිඟමන් යදී. මේ අන්කිසිවෙකු නොව ශ්‍රීලංකා සේනාංකයෙට අණ දුන් සිංහළ යුද ආඥාපතිවරයා ම ය. ඉතින් දෙමළ ඩයස්පෝරාව සංතෝෂ වන බව අහන්නට දෙයක්ද?

යුද්ධයෙන් දිනන්නට බැරිවූ දේ කොටි මුදල් මගින් කරගනීවිය යන බව අප පත්‍රය මගින් කලින් පෙන්වා දී ඇති අන්දමටම එය සිදුව ඇත. එසේ නැත්නම් ජෙනරාල් එවැනි පාවාදීමක් කළේ ඇයිදැයි විමසීම වටී. රටක හමුදාපති සියළු යුද රහස් හා ආරක්ෂක තත්වයන්ට අදාළ තොරතුරු හා රහස් රකින්නට දිවිහිමියෙන් බැඳී සිටී. එය කඩකිරීම අතිශය නින්දිත ද්‍රෝහිකමකි. ආරක්ෂක තත්වයන් හා පසුගිය යුද්ධය ගැන කුමන ප්‍රශ්න කවුරු ඇහුවත් උත්තර නොදී සිටින්නට ඔහුට අයිතියක් ඇත. ඕවා අහන්න එපා යයි කෙළින්ම කියන්නට ඔහුට පුළුවන. එහෙත් ජෙනරාල් මෙහිදී කර ඇත්තේ කොටින්ගේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමක් නොවේද? ගෝඨාභය හෝ වෙනයම් වගකිව යුතු කෙනෙක් හා අමනාපයක් ඇත්නම් එය වෙනම විසඳා ගත යුතුය. ඒ සඳහා තම රට හා ජාතිය බාල්දු කරන්නට, එයට අවමන් කරන්නට, එය අනතුරේ හෙළන්නට යාම මහා ම ද්‍රෝහිකමය. එවැන්නකු ජනපති වුවහොත් රටකට කුමක් සිදුවෙනවා ඇත්දැයි සිතන්නට වත් බැරිය.

## දුෂ්ට අසත්‍ය ප්‍රචාර හා නොයෙක් කටකතා පැතිරවීම

සති ගණනාවක් තිස්සේ රජයට එරෙහිව අසත්‍ය ප්‍රචාරයන් හා කටකතා පැතිරවීම සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතී. කොළඹ හා ඒ අවට නගරවල මෙය ජයට සිදුවේ. කීප දෙනෙක් රැස්වූ තැන්වල හා උත්සව ප්‍රිය සම්භාෂණ ආදියෙහි දී මෙම කටකතා පැතිරවීම කෙරේ. කතාව අගට යොදාගන්නේ **ලු** ප්‍රත්‍යයයි. කිව්වලු, ගියාලු, ගත්තලු, දුන්නලු ආදී වශයෙනි. මෙම කටකතා වෙබ් අඩවි මාර්ගයෙන් ලොව පුරා බෙදාහැරීම කෙරේ. බොහෝ විට මේ කටකතා රාජපක්ෂ පවුල හා ගෙතුණු ඒවා ය. ඔවුන් කොළඹ අවට ඉඩකඩම් හා ව්‍යාපාර මිළට ගත් බව දැක්වීමටය. මේ කියන අන්දමට රාජපක්ෂවරු කොළඹින් බාගයකටත් වඩා මිළට ගෙන ඇත. මේ බොරු ගොතා ඇත්තේ ජනතාව නොමග යවනු පිණිසය. රජයට හෝ රාජපක්ෂ පවුලට කිසිසේත් හිතවත් කෙනෙකු නොවන නමුත් **වික්ටර් අයිවන්** සිය **රාවය** පත්‍රයෙන් මේ බොරු ගැන සඳහන් කර හැකිනම් මේ එකක්වත් රාජපක්ෂලා කළ බවට එකම ලියවිල්ලකින් හෝ ඔප්පු කරන ලෙස අභියෝග කළේය. කවුරුත් එයට නිහඬ වූහ. මේ කතා සියල්ලම රජය අපකීර්තියට පත්කරන්නට පොන්සේකා පිළට හිතවත් අය ගෙතූ අතේ රෝල් ය.

## ජවිපෙ රඟපාන චරිතය

එක්සත් ජාතික පක්ෂයට හිතැති සාමාන්‍ය ජනතාව පවා අද දවසේ ලංකාවේ කොටි ත්‍රස්තවාදය නැතිවීම හා තම දරුවන්ට භීතියෙන් තොරව පාසැලට යන්නටද, තමනට රැකියාවට හෝ එළියට බැස වෙනත් ඕනෑම ගමනක් බිමනක් යන්නටද හැකිවීම ගැනත්, රජය කරගෙන යන සංවර්ධන පිළිවෙලවල් ගැනත් පැහැදී සිටිති. එහෙත් එජාපයේ පැරණි ඇටුවම් බැහැපු ඇතැම් අයට උවමනාව ඇත්තේ ධනපති පංතිය හා ලොකු ව්‍යාපාරිකයන් දියුණුකර, බටහිරට ගැති වී, කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාවද ව්‍යාපාරවලට හවුල් කරගෙන, රටේ සාමය අගයන සාමාන්‍ය ජනතාව වහලුන් හැටියට ගනිමින් රට විනාශය වෙත ගෙන යන්නටය. නැවත රටේ ආරක්ෂක තත්වය දුර්වල වී යළිත් කොටින්ට දොරටු විවෘත වුවාට උන්ට කමක් නැත. වර්තමාන රජය කෙසේ හෝ පැරදවීමේ ඔවුන්ගේ අරමුණ එයයි. මෙතෙක් ජනතා හිතවාදී ලෙස ක්‍රියාකරගෙන ආ ජනතා විමුක්ති පෙරමුණ අද මෙම ප්‍රතිගාමී එමෙන්ම ජයග්‍රහණයට විරෝධය පෑ, කුඩුකේඩුකම් කළ, පාච්චල් කළ ද්‍රෝහීන් කල්ලියක් සමග එක්වී රජය පෙරළා දැමීමට හවුල් වී සිටිති. ඒ අන්කිසිවක් නිසා නොව ඔවුන්ට හැමදාමත් තිබුණු, කෙසේ හෝ බලයට ඒමේ කෑදරකම නිසාය. සරත් පොන්සේකා ඒ සඳහා හොඳ තුරුම්පුවක් යයි ඕව්හු සිතති. අවසානයේ මොවුන් නවතින්නේ කොතැනද? බලයේ නම් නොවේ.

## ජෙනරාල් කල්ලියේ ජනපතිවරණ පොරොන්දු

ජෙනරාල් දිනුවොත් ඉටුකරන පොරොන්දු ගැන කතාබහ කරතත් මේ කිසිවක් ලියවිල්ලක පත්‍රිකාවක නැත. ඔහුගේ රැස්වීම් වලදී පළකළ අදහස් වලින් අහුලාගත් කීපයක් මෙසේය.

ඉන් මූලික දේ විධායක ජනපතිධුරය අහෝසිකරන බවය. එය ඔහු කියන තරම් ලේසි නැති බව කවුරුත් දනිති. එසේ වෙනස් කරන්නට තුනෙන් දෙකක පාර්ලිමේන්තු බලයක් අවශ්‍යයය. ජනමතයක් ද විමසා ඊට කැමැත්ත ගත යුතුය. එසේ නැතිව “ මම ආ ගමන් ඒක වෙනස් කරනවායයි කීවාට වෙනස් කළ නොහැකිය. එසේ වෙනස් කෙරුවායයි කියමු. එවිට විධායක බලතල ලැබෙන්නේ අගමැතිටය. ජනාධිපති නිකම් ඔහේ නමට පමණක් සිටී. එහෙත් සරත් පොන්සේකා ළඟදී කීවේ තමාට ගොපල්ලව වගේ නමට පමණක් ඉන්න ජනපතිකමක් වැඩක් නැති බවය. එසේ නම් ඔහු වෙනස් කරනවායයි කියන්නේ මොකක්ද? මොකටද? මෙය කිසිවෙකුට නොතේරෙන අපභ්‍රංසයකි.

ඔහුගේ ඊළඟ පොරොන්දුව ප්‍රජාතන්ත්‍රවාදය නගා සිටවීම ය. නගාසිටවන්නට තරම් දැනට ලංකාවේ කඩා වැටුණු ප්‍රජාතන්ත්‍රවාදයක් නැත. ඒ කතාවට සපෝට් කරන යූඇන්පි යට හෝ ජවිපෙ කට්ටියට ප්‍රජාතන්ත්‍රවාදයක් නැංවීම ගැන කතා කළ හැකිද? 82, 83 කාලයේ තිබුණු භීෂණය අප රටේ ජනතාවට හොඳින් මතකය. “ඡන්දය දාන්න කවුරු හරි හෙට ගියොත් වෙඩි තියනවා” යයි කිව්වේය. ඒ වගේම වෙඩි තිබ්බේය. ලේක්හවුස් පත්තර මිළට ගත්තොත් මරණවා යයි කීවේය. පත්තර වික්කේ හමුදාවේ ආරක්ෂා වද ඇතිවය. දැන් ඒ අය ප්‍රජාතන්ත්‍රවාදය නගා සිටුවන බවට ප්‍රතිඥා දෙති. මේ කතා තනිකරම විහිළු තහළුය. මෙවැනි දියාරු පොරොන්දු වලට ජනතාවගේ ඡන්දය දිනාගත නොහැකිය. මෙහි රට ගැන බරපතළව සිතන, ස්ථිර ඉදිරි සැලැස්මක් ඇති සරත් පොන්සේකා කෙනෙක් අපට නොපෙනේ. ඔහු වටා ඉන්නා අනෙක් මිනිසුන් දිහා බැලූ විට ඉඩ ලැබුණොත් ඔවුන් රට කොයි අත ගෙනයාවිදැයි සිතා ගත හැකිය.

## උතුරේ දෙමළ ඡන්ද

උතුරේ සහ නැගෙණහිර දෙමළ ඡන්ද ජනාධිපතිවරණයකදී ලොකු තැනක් ගනී. මෙය ගිය ජනපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ පැත්තට බරව ක්‍රියාත්මක වූයේ ප්‍රභාකරන් විසින් එහි දෙමළ ජනතාවට කිසිවෙකුට ඡන්දය දෙන්න එපා යයි බලකර සිටි නිසායයි කියති. එහෙත් අද එවැනි බලපෑමක් කරන්නට ප්‍රභාකරන් හෝ කොටි සංවිධානය නැත. දෙමළ මිනිසුන් බය ගන්වන්නටද කවුරුවත් නැත. රනිල්ලාට එකතුව සිටින TNA දෙමළ අය කන්නලව් කළත් උතුරේ අය ඔවුන්ට අවනත නොවේ. කරුණා සහ පිල්ලෙයාන් දෙදෙන රජය පැත්තට නැගෙණහිර දෙමළ ඡන්ද හරවන්නට සූදානම්ය. එසේම රාවුෆ් හකීම් අද මුස්ලිම් ජනතාව අතර එතරම් බලපෑමක් කරන්නට සමත් පුද්ගලයෙකු ලෙස කිසිසේත් නොපෙනේ. මේ කරුණු නිසා ජෙනරාල් ෆොන්සේකා දිනන බවට ගණන් හදන අය දෙමළ මුස්ලිම් ඡන්ද සියල්ලම ඔහුට වැටේයයි සිතා සිටින නමුත් සැබෑ තතවය එසේ නොවේ.

දෙමළ ජාතික සන්ධානය හෙවත් TNA ද දැන් දෙකට බෙදී ඇත. ඔවුන්ගේ මන්ත්‍රී කෙනෙක්ද ජනපතිවරණයට තරඟ කරයි. සම්බන්ධන් ඇතුළු TNA මන්ත්‍රීවරු කීප දෙනෙක් මහින්දට උදව් කරන්නට සූදානම් බවත්, ඔවුන්ගේ කොන්දේසි ගණනාවකට එකඟ විය යුතුබවත් කීහ. එහෙත් රජය එම කොන්දේසි ප්‍රතික්ෂේප කළ විට TNA සරත් කඳවුර වෙත ගොස් එම කොන්දේසි ඉදිරිපත් කළවිට ඔවුන් පිළිගෙන ඇත. ඒ අනුව දැන් සම්බන්දන්ලාගේ සපෝට් එක ජෙනරාල්ටය. ඔවුන් ඉදිරිපත් කළ කොන්දේසි 11 කට ජෙනරාල් අත්සන් තබා ඇත. ඉන් මූලිකම දේ දැනට සිරබාරයේ සිටින සියළුම කොටි සාමාජිකයන් වහා නිදහස් කර දමන ලෙසය. උතුරේ හමුදා ආරක්ෂක කඳවුරු ඉවත් කිරීමද තවත් ඉල්ලීමකි. ඒ බොහෝ ඉල්ලීම් නැවත කොටි ත්‍රස්තවාදය පැළකිරීමට අවශ්‍ය පාත්ති සකස්කිරීමක් නොවේද? ජීවිත දහස් ගණනක් පරිත්‍යාග කොට ලත් ඒ ජයග්‍රහණයන් ඡන්ද කීපයක් ලබාගැන්ම සඳහා පාවාදීමට ඒ ජයග්‍රහණයේ මුලටම සිටි ජෙනරාල් සූදානම් වීමක් ලෙස ඇතැම් අය සරත් පොන්සේකා සහ TNA සම්බන්ධතාව හඳුන්වති.

ප්‍රභාකරන් කළාක් මෙන් දකුණෙන් එන කාටවත් ඡන්දය දෙන්නට එපායයි TNA සහ විදේශගත දෙමළ ඩයස්පෝරාව උතුරේ දෙමළ ජනතාවගෙන් මෙවර ද ඉල්ලා සිටින්නට බැරි නැත. එය උතුරේ ජනයා වෙනම තමාගේ දෙමළ රාජ්‍යයක් ඉල්ලා සිටින බවත්, ඔවුන් දකුණේ කිසිදු දේශපාලනයකට සම්බන්ධ නැති බවත් ඔවුන්ට එවිට ලෝකයාට පෙන්විය හැකිය.

## අප රටේ සිදුවූ වෙනස්වීම් සහ අපේ ඉදිරි මග

වසර හතරකට පෙර ජනාධිපති මහින්ද රාජපක්ෂ රටේ පාලකයා වශයෙන් පත්වන විට අප රට තිබූ තත්වය යළිත් සලකා බලනු වටී.

♦ ශ්‍රීලංකාව තිබුණේ දෙකට කැඩෙන්නට ඔන්න මෙන්න කියාය.

♦ රටේ සමහර පළාත් තිබුණේ කොටි ත්‍රස්තවාදීන්ගේ පාලනය යටතේය. ත්‍රස්තයින්ගේ තුවක්කු බලයට යටවී, උන්ට කප්පන් බදු ගෙවා ජනතාවට එහෙ මෙහ යන්නට සිදුවිය.

♦ ජනතාවගේ අනාගත බලාපොරොත්තු හා විශ්වාසය සහමුලින්ම සුන්වූ තත්වයක තිබුණි. ශ්‍රීලංකා සන්නද්ධ හමුදා යුද්ධ කරන්නට අපහසු තත්වයක, බොහෝ විට කඳවුරු ඇතුළට වී කුමක් කරන්නටදැයි නොදැන කලකිරීමෙන් බලා සිටි කාලයකි.

♦ ශක්තිමත් රජයක් එකල තිබුණේ නැත. එය වැඩි ආසන දෙකකින් හෝ තුනකින් පමණක් එල්ලී තිබුණු දුර්වල රජයක් විය.

♦ ගොඩනැගිලි, මංමාවත් අබලන්ව, අත්‍යවශ්‍ය සේවා අක්‍රමවත්වූ අතර, නිතර විදුලිබලය කැපීම්, ඇනහිටීම් ආදිය නිසා ජනතාව ඉතා අපහසු තත්වයකට පත්ව සිටියේය.

♦ නිශ්පාදනය අඩාලව තිබූ අතර, ආර්ථිකය ඉතා පහළ මට්ටමක පැවතියේය.

♦ විදේශයෙන් පැමිණ සිටි රාජ්‍ය නොවන සංස්ථා (NGO) කොටින්ට උදව් කරමින් හිතුමතයට හැසිරෙමින් ඉදුමුණු බවකින් කටයුතු කළෝය. නෝර්වේ ආදී පිරිස් සිය අභිමතය පරිදි අප රටේ කටයුතුවලට ඇඟිලි ගැසූහ. උන්ට ඇඟිල්ලක් ඔසවන්නටවත් කෙනෙක් නැති නිවට නියාළු දුර්වල පාලනයක් එකල වීය.

♦ දිනපතාම වාගේ බෝම්බ පිපිරී, මිනිස් ඝාතන අතෝරයක් නැතිව සිදුවූ අතර, ජනතාව ජීවත් වූයේ ජීවිතයත් මරණයත් අතරය. ඉන් එහාට සිතන්නට ඔවුන්ට හැකියාවක් නොවීය. යුද්ධය කිසිදින ජයගත නොහැකි බව පෙනිණ.

♦ රටේ ඉඩම් පවා විදේශිකයන් පැමිණ මිළදී ගන්නට විය.

♦ මතු බලාපොරොත්තුවයයි කිසිවක් අප රටේ ඉතිරිව තිබුණේ නැත.

♦ එකල සිටි දේශපාලකයෝ මේ යුද්ධය හන්දා කිසිවක් කරන්නට බැරියයි කියා යුද්ධය නිදහසට කාරණයක් ලෙස ගෙන තම දූෂණ ගනුදෙනු සහ දුර්වලකම් වසාගත්හ.

## සත්‍යය දිහා ඇස් ඇර බලන්න

රාජපක්ෂ පාලනය පටන්ගත් දා සිට අප රටේ සිදුවූ අති විශාල වෙනස්කම් ගැන ඔබට අමුතුවෙන් කිවයුතු නැත. ඉහත දැක්වූ සියලු කාරණාවලට සුබදායක විසඳුම් ඔහු යෙදූ සැටි ඔබම දනී. කිසිදාක දිනන්ට බැරියයි කී යුද්ධය ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ඒ අප වීරෝදාර සන්නද්ධ හමුදාවෝ ජයගත්හ. ඔවුන්ට ජාතිය පමණක් නොව විදේශය පවා ගෞරව කරති. කොටි ත්‍රස්තවාදය අප මාතෘභූමියෙන් යළි නොඑන්නටම අතුගා දමා ඇත. ජනතාව සිතේ බිඳකුදු බියකින් තොරව සැහැල්ලු සිතින් රටේ ඕනෑම තැනක දැන් යති, එති. අප රට අවුරුදු **30** ක් දුක් කඳුලින් නැවෙමින් ගතකළ කාලය නිමාවීම පමණක් අප ගැන අපටම සතුටට පත්වීමට ප්‍රමාණවත්ය. මෙම ජනපතිවරණයේදී ශ්‍රීලංකා ජනතාව සිතිය යුත්තේ ඒ ලබාගත් උතුම් නිදහස හා අභිමානය ගැනය. ඒ සියල්ල මකාදමන කිසිම වැරදි තීරණයක් ජනතාව නොගනු ඇතැයි අපේ දැඩි විශ්වාසයයි.





← එදා සහ අද →